Équité
ශ්‍රී ලංකා HUMANITY for ALL



# ශ්‍රී ලංකාව තුළ ජීවත් වන විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ යුක්තිය සම්බන්ධ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම

# ශ්‍රී ලංකාව තුළ ජීවත් වන විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ යුක්තිය සම්බන්ධ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම

**(ජනවාරි 2018 – දෙසැම්බර් 2022)**

ඉක්විටි ශ්‍රී ලංකා ප්‍රකාශනයකි

# ශ්‍රී ලංකාව තුළ ජීවත් වන විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ යුක්තිය සම්බන්ධ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම

(ජනවාරි 2018 – දෙසැම්බර් 2022)

ඉක්විටි ශ්‍රී ලංකා විශ්ලේෂණයකි

ශ්‍රී ලංකා HUMANITY for ALL

ඉක්විටි ශ්‍රී ලංකා ප්‍රකාශනයකි

equitesrilanka2019@gmail.com



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පටුන

කෙටි යෙදුම් ........ 3
විධායක සාරාංශය ........ 4
පරිච්ඡේදය 1 : ක්‍රමවේදය ........ 5
පරිච්ඡේදය 2 : පසුබිම් විශ්ලේෂණය ........ 8
පරිච්ඡේදය 3 : නීති සහ ප්‍රතිපත්ති රාමුව ........ 11
පරිච්ඡේදය 4 : සොයාගැනීම් ........ 14
පරිච්ඡේදය 5 : අධ්‍යාපනය ........ 16
පරිච්ඡේදය 6 : රැකියා නියුක්තිය ........ 18
පරිච්ඡේදය 7 : අත්‍යාවශ්‍ය සේවා ලබාගැනීම ........ 21
පරිච්ඡේදය 8 : පොලිස් ප්‍රචණ්ඩත්වය ........ 23
පරිච්ඡේදය 9 : නීති සහ ප්‍රතිපත්ති රාමු පිලිබඳව ඇති දැනුම සම්බන්ධ අඩුපාඩු ........ 25
නිර්දේශ ........ 26



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## කෙටි යෙදුම්

| | |
|---|---|
| සීඩෝ: | කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම සඳහා වන කමිටුව (The Committee on the Elimination of Discrimination against Women – CEDAW) |
| සී එස් ඕ: | සිවිල් සමාජ සංවිධාන (Civil Society Organisations – CSO) |
| ජී ආර් සී: | ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හඳුනාගැනීමේ සහතිකපත (Gender Recognition Certificate – GRC) |
| **HIV**/ඒඩ්ස්: | මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය (Human Immunodeficiency Virus – HIV)/නතුකරගත් ප්‍රතිශක්ති ඌනතා සහලක්ෂණය (Acquired Immunodeficiency Syndrome – AIDS) |
| **ILO**: | ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labour Organisation – ILO) |
| විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව: | සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී/ලිංගික, ප්‍රශ්නකාරී, සහ අන්තර්ලිංගික (Lesbian, Gay, Bisexual, Trans, Queer/Questioning, Intersex and Other – LGBTIQ+) |
| **PLHIV**: | මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය සමග ජීවත්වන මිනිසුන් (People Living with Human Immunodeficiency Virus – PLHIV) |
| ප්‍රෙප් සහ පෙප්: | ප්‍රෙප් (Pre-Exposure Prophylaxis – PrEP) සහ පෙප් (Post-Exposure Prophylaxis – PEP) |
| **SOGIESC**: | ලිංගික දිශානතිය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (Sexual Orientation, Gender Identity, Gender Expression and Sex Characteristics – SOGIESC) |
| **UPR**: | විශ්ව කාලාන්තර සමාලෝචනය (Universal Periodic Review – UPR) |



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

# විධායක සාරාංශය

1. විවිධ ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා හා ප්‍රකාශන ඇති පුද්ගලයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන, මානව හිමිකම් උද්දේශකයින් සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ ක්‍රියාකාරීන්ගෙන් ලැබූ මහත් වූ දායකත්වයද සමග, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව පිළිබඳ පවතින සංවාදය පසුගිය වසර කිහිපය තුළදී වඩාත් ප්‍රමුඛව ඉස්මතු විය. යුක්තිය ලබාගැනීමේදී ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව අභියෝග රැසකට මුහුණපාන අතර, වෙනස්කොට සැලකීම්, හිංසාකාරී ක්‍රියා සහ ප්‍රචණ්ඩත්වය ඒවා අතර වේ. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම නීතියෙන් පැහැදිලි ලෙස තහනම් කොට නැත. තවද, ජාත්‍යන්තර වගකීම් සහ පොරොන්දු ඉටුකිරීමට ශ්‍රී ලංකාව එකඟ වී ඇති පසුබිමක වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා හෝ වෙනත් නීතියක් හරහා මෙම ප්‍රජාව ආරක්ෂා කොට හෝ පිළිගෙන නොමැත..

2. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් සිදුකරන අත්අඩංගුවට ගැනීම්, නීතිමය පියවර ගැනීම් සහ සිරගත කිරීම් මෙන්ම, වෙනස්කොට සැලකීම් හා හිංසාකාරී ක්‍රියාවලට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින් ලක්වීමේ අවධානමක් ඇත. සෞඛ්‍ය, අධ්‍යාපන සහ රැකියා අවස්ථා ලබාගැනීමේදී පවා විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින් වෙනස්කොට සැලකීම්වලට මුහුණපායි..

3. මෙම අභියෝගවලට විසඳුම් ලබාගැනීම සඳහා, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හා ප්‍රකාශනය නොසලකා සියලුම පුද්ගලයින්ට නීතිය යටතේ සම ආරක්ෂාවක් තහවුරු කරන නීතිමය සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් අවශ්‍ය වේ. කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියාකාරකම් අපරාධීකරණය කර ඇති නීති අහෝසි කිරීම මෙන්ම, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හා ප්‍රකාශනය මත පදනම්ව සිදුවන වෙනස්කොට සැලකීම තහනම් කරන නීති පැනවීම වැනි පියවර මීට ඇතුළත් ය.

4. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ අයිතීන් තහවුරු කිරීමට සමාජ සංක්‍රාන්තියක් අත්‍යාවශ්‍ය වන අතර, නීතිමය වෙනස්කම් පමණක් ප්‍රමාණවත් නොවේ. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව පිළිබඳව ශ්‍රී ලාංකීය සමාජය තුළ පවතින අවබෝධය සහ පිළිගැනීම වඩාත් ප්‍රචලිත කිරීම සඳහා අධ්‍යාපනය සහ දැනුවත්භාවය වැඩිකිරීමේ ප්‍රයත්න අත්‍යාවශ්‍ය වේ. මෙම ප්‍රයත්න යටතේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, සෞඛ්‍ය සේවා සපයන්නන් සහ අනෙකුත් සේවා සපයන්නන් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සුදානම් කිරීම සඳහා, පිළිගැනීමේ වැඩිකිරීමේ අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සහ එකී පාර්ශවයන් ඉලක්ක කොටගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කළ හැකිය.

5. කෙසේනමුත්, නීතිමය වෙනස්කම් තුළින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට ආරක්ෂාකාරී බවක් සහ නීතිමය රැකවරණයක් ලබාදීම සිදුවන හෙයින්, එවැනි වෙනස්කම් අතිශයින්ම වැදගත්ය. එවැනි පියවර විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින් පිළිබඳව සමාජය තුළ දැනුවත්භාවය වැඩිකිරීමට සහ පොදුජනයා සමග ඵලදායී සංවාදයක් ගොඩනගාගැනීමට උදව් වේ. එය ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හා ප්‍රකාශනය මත පදනම්ව පුද්ගලයින් මුහුණපාන හිංසන අවම කිරීමට දායක වනු ඇත. එනිසා, මෙම ප්‍රජාව යුක්තිය ලබාගැනීමේ ක්‍රියාවලිය තුළ පවතින පරතරයන් වටහාගැනීම සහ විසඳීම විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවට ගෞරවයෙන් යුතුව ජීවත්විය හැකි ආරක්ෂාකාරී පරිසරයක් තහවුරු කිරීමේදී අතිවිශාල බලපෑමක් ඇති කරනු ඇත.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 1 : ක්‍රමවේදය

1.	විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ යුක්තිය සම්බන්ධ අවශ්‍යතා කලින් කල විශ්ලේෂණය කිරීමට ඇති අවශ්‍යතාවය හේතුවෙන්, මෙය යාවත්කාලීන වන වාර්තාවක් ලෙස පවතිනු ඇත. මෙම වාර්තාව සැකසෙන්නේ එම වැයමේ පළමු පිටපත ලෙස වන අතර, මෙම වාර්තාව සැකසීමේදී පහත ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

2.	දත්ත එක්රැස් කරගැනීම: දත්ත එක්රැස් කරගැනීම ක්‍රම දෙකකට සිදු කරන ලදී. එනම්, සමීක්ෂණයක් පැවැත්වීම සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීමයි. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජා සාමාජිකයින් 130ක් සහභාගිවූ  අතර, සමස්ත දිවයිනම ආවරණය වන ලෙස පැවැත්වූ සමීක්ෂණයට ප්‍රතිචාර 192ක් ලැබුණි. මධ්‍යම පළාත, නැගෙනහිර පළාත, උතුරු පළාත, වයඹ පළාත, උතුරු මැද පළාත, දකුණු පළාත, සබරගමුව පළාත, සහ බස්නාහිර පළාත යන පළාත් නියෝජනය කරන ප්‍රතිචාර දක්වන්නන්ගේ සහභාගීත්වයෙන් යුතුව ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා හයක් පවත්වන ලදී. මෙහිදී සහභාගීවූවන් සිය තොරතුරු සහ අත්දැකීම් බෙදාගැනීමේදී කැමැත්ත පලකරන ගිවිසුමකට ද අත්සන් කරන ලදී. සහභාගීවූවන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා, මෙම වාර්තාවට ඇතුළත් කර ඇති සිද්ධීන් සහ ප්‍රකාශ අන්වර්ථ නාමයන් යටතේ සඳහන් වේ. තවද, මෙම වාර්තාව සැලසුම් කිරීමේදී සහ අවසන් කිරීමේදී විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සිවිල් සමාජ සංවිධාන සමග උපදේශන සාකච්ඡා දෙකකුත්, නීතීඥයින් සමග උපදේශන සාකච්ඡා කිහිපයකුත් පවත්වන ලදී.






භෞතික කණ්ඩායම් රැස්වීම්


මධ්‍යම පළාත, නැගෙනහිර පළාත, උතුරු පළාත, උතුරු මැද පළාත, වයඹ පළාත, සබරගමුව පළාත, දකුණු පළාත සහ බස්නාහිර පළාත




මාර්ගගත සමීක්ෂණ බෙදා හැරීම – සමස්ත ලංකා



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.






© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

3. පරාමිතීන්: පසුගිය වසර පහ තුළ, එනම්, 2018 සිට 2022 දක්වා, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ අධ්‍යාපන, රැකියා සහ අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධ අවශ්‍යතා සැපිරුනාද යන්න විශ්ලේෂණය කිරීමට මෙම සමීක්ෂණය සීමා විය. කෙසේනමුත්, මෙම සාකච්ඡා, විශේෂයෙන්ම ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා, ඉහත සඳහන් කළ තේමාත්මක විෂයන්වලට සීමා වුයේ නැත. ශ්‍රී ලංකාවේ පවතින නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව සහ යුක්තිය පිලිබඳව පවතින තත්වය ගැන සිය අදහස් සහ අත්දැකීම් බෙදාගැනීමට ප්‍රජා සාමාජිකයින්ට අවස්ථාවල ලබාදෙන ලදී.

4. ඉදිරිපත් කිරීම: මෙම සමීක්ෂණයට අදාළ විෂය ක්ෂේත්‍රය ප්‍රධාන කොටස් දෙකක් යටතේ ඉදිරිපත් කොට ඇත. එනම්, පසුබිම් විශ්ලේෂණය සහ සොයාගැනීම් යනුවෙනි. පසුබිම් විශ්ලේෂණය ගොඩනගා ඇත්තේ පුළුල් ද්විතියක තොරතුරු විවරණය මත පදනම්ව වන අතර, සොයාගැනීම් ඉදිරිපත් කොට ඇත්තේ සමීක්ෂණය සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා තුළින් එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරීම මගිනි. වාර්තාව තුළ ඉදිරිපත් කර ඇති නිර්දේශ මෙම කොටස් දෙකම මත පදනම්ව ඇත. මෙම වාර්තාව තුළ භාවිත කර ඇති කෙටි යෙදුම්, පටුන යටතේ ඇති කෙටි යෙදුම් යටතේ ලැයිස්තු ගතකර ඇත.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 2 : පසුබිම් විශ්ලේෂණය

### ශ්‍රී ලංකාව තුළ සිටින විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ට එරෙහිව පවතින ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්තිය

1. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ලෙස තමන්ව හඳුන්වාගන්නා පුද්ගලයින් සමස්ථ ලෝකය පුරාම විවිධ මට්ටම්වල අවමන් සහගත සැලකීම්, කොන්කිරීම් සහ වෙනස්කොට සැලකීම්වලට දිගින් දිගටම ලක්වේ. ලොව පුරා විසිරී සිටින විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ගේ අයිතීන් ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රයත්න ඉක්මන් කිරීම සඳහා ශක්තිමත් ගෝලීය ව්‍යාපාරයක් පැවතුනද, වර්තමානයේදී, රටවල් 67ක් තුළ කැමැත්තෙන් සිදුවන සමලිංගික ක්‍රියාකාරකම් අපරාධීකරණය කර ඇති අතර රටවල් 14ක් තුළ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාව සහ/හෝ ප්‍රකාශනය අපරාධීකරණය කර ඇත්තේ මිලියන ගණනාවක් අත්අඩංගුවට ගැනීමේ, නීතිමය පියවර ගැනීමේ සහ සිරගත කිරීමේ අවධානමට නිරාවරණය කරමිනි. තවද, රටවල් 11ක් තුළ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ට මරණ දඬුවම ලබාදිය හැකිය.[1]

2. ශ්‍රී ලංකාව තුළ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවවීම කතාකිරීමට පවා තහනම් මාතෘකාවක් ලෙස දශක ගණනාවක් පුරාවට පැවතුණු අතර, විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා හා ප්‍රකාශන සහ ලිංගික දිශානති ඇති පුද්ගලයින් කායික, මානසික සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වීම පිලිබඳ දිනපතාම වාර්තා වේ. එසේම, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ සාමාජිකයින්ට බොහෝ අවස්ථාවලදී සම අධ්‍යාපනික සහ රැකියා අවස්ථා ලබානොදෙන අතර, එය ගෘහස්ථ පරිසරවලදී මෙන්ම ප්‍රජාවන් තුළද දක්නට ලැබේ. සේවා සැපයමේ අංශය තුළ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ට එරෙහි අවමන් සහගත සැලකීම් සහ වෙනස්කොට සැලකීම් වඩාත් බහුලව පවතී. මීට රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයද ඇතුළත් වන අතර, හිංසනයට ලක්වීමේ බියකින් තොරව අත්‍යාවශ්‍ය සේවාවන් ලබාගැනීම ප්‍රජා සාමාජිකයින්ට අසීරු වී ඇත.

3. රට තුළ වර්තමානයේ පවතින සමාජ-ආර්ථික සහ දේශපාලනික සංදර්භය මෙම අසමානතා වඩාත් පුළුල් කර ඇති බව කිව හැකිය. ඒ, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ඇතුළු ආන්තිකකරණය වී ඇති ප්‍රජාවන් රටේ පවතින තත්වයට අනුකූලව වෙනස්කොට සැලකීම් ගණනාවකට මුහුණපාන බව පැහැදිලි තත්වයක් තුළයි. 42වන යූ පී ආර් සැසියේදී ඉක්විටි ශ්‍රී ලංකා විසින් සිදුකළ ප්‍රකාශය තුළින්ද පැහැදිලි කළේ, ආර්ථික තත්වය අයහපත් වීම විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ සෞඛ්‍ය සම්බන්ධ අවශ්‍යතා සපුරාගැනීමට දැඩි ලෙස බලපා ඇති බවයි. මෙම අවශ්‍යතා අතර හෝමෝන, පී එල් එච් අයි වී සඳහා අවශ්‍ය ඖෂධ සහ ප්‍රෙප් සහ පෙප් හිඟයද වේ. තවද, රැකියා කප්පාදු කිරීමේ ක්‍රියාවලිය තුළදී, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා හා ප්‍රකාශන සහ ලිංගික දිශානති මත පදනම්ව රැකියාව අහිමිවීමේ තර්ජනයට ප්‍රජා සාමාජිකයින් රැසක් මුහුණපායි.[2]

4. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ අයිතීන් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින නීති සහ ප්‍රතිපත්ති රාමුවට ධනාත්මක වෙනස්කම් සිදුකිරීම පිලිබඳව පසුගිය අවුරුදු කිහිපය පුරා විවිධ දේශපාලකයින් ප්‍රකාශ සිදු කොට ඇත. එක්සත් ජාතීන්ගේ *#ZeroDiscriminationDay* (වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම සඳහා වෙන්වූ දිනය) යෙදෙන 2021 වසරේ මාර්තු 1 වනදා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ට්විටර් සමාජ මාධ්‍ය හරහා පළකළ පණිවිඩයකට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවගෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබුණි. ඒ, ''අද *#ZeroDiscriminationDay*. ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස, වයස, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, ලිංගික

---

[1] හියුමන් ඩිග්නිටි ට්‍රස්ට්, එල් ජී බී ටී වීම අපරාධීකරණය කර ඇති රටවල්: https://www.humandignitytrust.org/lgbt-the-law/map-of-criminalisation/

[2] ඉක්විටි ශ්‍රී ලංකා විසින් ඉදිරිපත් කළ 42වන යූ පී ආර් සැසියේ පූර්ව සැසි ප්‍රකාශනය https://www.upr-info.org/sites/default/files/country-document/2022-11/Equite_Statement_Presession42_SriLanka.pdf



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

දිශානතිය, ලිංගිකත්වය, ජාතිය, කායික පෙනුම සහ විශ්වාස ආදිය නොසලකා සියලුදෙනාගේම ගෞරවයෙන් යුතුව ජීවත්වීමේ අයිතිය සුරැකීමට මම අදිෂ්ඨාන සහගතව සිටිමි,''[3] යන පණිවිඩයයි.

5. එමෙන්ම, ''සියලු ශ්‍රී ලාංකිකයින්ට ගෞරවයෙන් සහ හිංසනයට ලක්වීමේ බියෙන් තොරව ජීවත්වීමට අයිතියක් ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, ලිංගික කැමැත්ත හෝ අනන්‍යතාවය මත පදනම්ව කිසිඳු පුද්ගලයකු වෙනස්කොට සැලකීමකට හෝ කිසිඳු ආකාරයක අපයෝජනයකට, අවමානයකට හෝ අසාධාරණයකට ලක්නොවිය යුතුය,'' යනුවෙන් වර්තමාන විදේශ කටයුතු අමාත්‍ය සහ හිටපු අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතා ප්‍රකාශ කළේය.[4] 42වන යු පී ආර් සැසියේදී ශ්‍රී ලංකාවට නිර්දේශ ලැබීමත් සමග, 2023 වසරේ පෙබරවාරි 9 වැනිදා ඔහු ප්‍රකාශ කළේ කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියා නිර්අපරාධීකරණය කරනු ඇති බවයි.[5]

6. පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිනී කවිරත්න මිය විසින් පරිවර්තන චිකිත්සාව තහනම් කිරීමටත්[6], පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා විසින් සම-ලිංගික ක්‍රියා අපරාධීකරණය කරන දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති සංශෝධනය කිරීමටත්[7], පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත් දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. කෙසේනමුත්, ඉහත සඳහන් කල ප්‍රයත්න සම්බන්ධයෙන් නීතිමය සංශෝධනයක් හෝ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැති අතර, එම කෙටුම්පත් දෙක පිළිබඳ වැඩිදුර පියවර ගැනීම නැවතී ඇත.

7. එසේම, ශ්‍රී ලංකාව තුළ වාර්තාගත දේශපාලනික සමරිසි භීතිකාවක් සහ සංක්‍රාන්ති සමාජභාවී භීතිකාවක් පවතී. ප්‍රසිද්ධියේ සමරිසිභීතික ප්‍රකාශයක් සිදුකරමින්, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පැවසුවේ හිටපු අගමැති සහ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ජාතික හරයන් ප්‍රතික්ෂේප කර ඇති බවත් ''සමනල ජීවිතයකට'' ඇතුළත්ව ඇති බවත්ය.[8]

8. තවද, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවඅයිතීන් පිළිබඳ සාකච්ඡා පැවැත්වුවත් ව්‍යවස්ථානුකූලව ඒවා පිළිගන්නේ නැති බව 2021 වසරේ අගෝස්තු 3 වනදා සම කැබිනට් ප්‍රකාශක සහ වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පැවසුවේය.[9]

---

3 ගෝඨාබය රාජපක්ෂ සිය නිල ට්විටර් ගිණුම වන @GotabayaR හි පලකළ පොස්ටුව - පළවූයේ 2021.03.21 https://twitter.com/GotabayaR/status/1366258501886955526

4 නිවුස් වයර් හි පළවූ "Justice Minister looks into allegations of forced examinations on privates of LGBT persons" - පළවූයේ 2020.10.31 https://www.newswire.lk/2020/10/31/justice-minister-looks-into-allegations-of-forced-examinations-on-privates-of-lgbt-persons/

5 මීරුදුලා තම්බයියා විසින් ද මෝනින් හි පලකළ "Homosexuality to be decriminalised" - පළවූයේ 2023.02.10 https://www.themorning.lk/articles/DTlRaTHSwT1O8hESDdqF

6 https://economynext.com/sri-lanka-opposition-mp-tables-private-motion-to-ban-conversion-therapy-91589/

7 ජනාධිපති මාධ්‍ය අංශය නිකුත් කළ "Amendment to the Penal Code handed over to President" - පළවූයේ 2022.08.04 https://www.presidentsoffice.gov.lk/index.php/2022/08/24/amendment-to-the-penal-code-handed-over-to-president/

8 කලම්බෝ ටෙලිග්‍රාෆ් හි පළවූ "Sirisena should be held responsible for homophobic incidents in sri lanka in coming days: Sri Lankan LGBTQI+ Community " - පළවූයේ 2018.11.08

https://www.colombotelegraph.com/index.php/sirisena-should-be-held-responsible-for-homophobic-incidents-in-sri-lanka-in-coming-days-sri-lankan-lgbtqi-community/

9 ඩේලි මිරර් හි පළවූ "Government asserts LGBT rights not legally recognised" - පළවූයේ 2021.08.2021

https://www.dailymirror.lk/breaking_news/Government-asserts-LGBT-rights-not-legally-recognised/108-217455



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

9. අමා දිසානායක නම් මනෝ උපදේශකවරිය විසින් මහනුවර ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් සඳහා කළ පුහුණුවීමක් අතරතුර සිදුකරන ලද මතභේදාත්මක සමරිසිභීතික ප්‍රකාශයක්[10] සම්බන්ධයෙන් දින 14ක් ඇතුළත ප්‍රතිචාර දක්වන ලෙස මානව හිමිකම කොමිසම පොලිස්පතිවරයාට දැනුම් දෙන ලදී. ඒ, සිද්ධිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම ඉදිරියේ පැමිණිල්ලක් ගොනුවීමෙන් අනතුරුවයි. තවද, එම වර්ෂයේම නොවැම්බර් මස විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවක්‍රියාකාරීන් විසින් අභියාචනාධිකරණය ඉදිරියේ රිට් පෙත්සමක් ගොනු කරන ලදී[11]. පොලිසිය අතින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම් සහ හිංසනයන් වැළක්වීම සඳහා රිට් නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ගොනුකර තිබූ පෙත්සමක් විභාගයට ගැනීමට 2021 වසරේ දෙසැම්බර් 8 වැනිදා අභියාචනාධිකරණය අවසර ලබාදෙන ලදී.[12] කෙසේනමුත්, මානව හිමිකම කොමිසම විසින් දියත් කළ පරීක්ෂණයේ ප්‍රතිඵලය හෝ රිට් පෙත්සම සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ සිදුවන ක්‍රියාවලියේ වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කර නොමැත.

---

[10] ද මෝනින් හි පළවූ "LGBT discrimination by Sri Lanka Police: Violation of their own laws in training?" https://www.themorning.lk/articles/153684
[11] ඩේලි එෆ් ටී හි පළවූ"Court of Appeal allows Equal Ground, others to serve notice to Police, Ama Dissanayake over homophobic training" - පළවූයේ 2021.11.17 https://www.ft.lk/news/Court-of-Appeal-allows-Equal-Ground-others-to-serve-notice-to-Police-Ama-Dissanayake-over-homophobic-training/56-726059

[12] අද දෙරණ හි පළවූ "Court permits to proceed with petition on police discrimination against LGBT community" - පළවූයේ 2021.12.08 http://www.adaderana.lk/news/79023/court-permits-to-proceed-with-petition-on-police-discrimination-against-lgbt-community



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 3 : නීති සහ ප්‍රතිපත්ති රාමුව

1. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය සම-ලිංගික ලිංගික ක්‍රියා අපරාධීකරණය කර ඇත. එකම ලිංගයකට අයත් පුද්ගලයින් දෙදෙනෙක් අතර ලිංගික ක්‍රියා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ වගන්තිය යටතට වැටෙන බව පුළුල්ව පිළිගනී. ''ස්වභාවධර්මයට විරුද්ධව කාමුක සංසර්ගයේ යෙදීම'' යන ක්‍රියාව 365 වගන්තියෙන් අපරාධීකරණය කරන අතර, ඊට වසර 10ක් දක්වා වන සිරදඬුවමක් සහ දඩයක් නියම කළ හැකිය. ''තවත් පුද්ගලයකු සමග තදබල අශෝභන ක්‍රියාවක් සිදුකිරීම'' යන ක්‍රියාව දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තියෙන් අපරාධීකරණය කරන අතර, ඊට වසර 2ක් දක්වා වන සිරදඬුවමක් නියම කළ හැකිය. සොඩොමි නීති හඳුන්වාදුන්නේ 1883 බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදී වන අතර, පසුව, 365අ වගන්තිය 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධනය) පනත හරහා සංශෝධනය කළේ කාන්තාවන් අතර ලිංගික ක්‍රියාද ඊට ඇතුළත් කිරීමට සහ ඊට පෙර තිබූ ''පිරිමි පුද්ගලයින්'' යන කොටස ''පුද්ගලයින්'' යනුවෙන් වෙනස් කිරීමටයි.[13] මෙම නීතිය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක නොකළත්, එය විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව අපරාධකාරයින් ලෙස සලකන බැවින්, ශ්‍රී ලංකාව තුළ ජීවත්වන විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම්වලදී ඊට ප්‍රධාන භූමිකාවක් ඇත. ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් අතර කැමැත්තෙන් ඇතිවන, සම-ලිංගික සබඳතා අපරාධීකරණය කිරීම මානව අයිතිවාසිකම් කඩකිරීමක් ලෙස 2022 වසරේ මාර්තුවලදී සීඩෝ කමිටුව විසින් නිගමනය කරන ලදී.[14] තවද, සම-ලිංගික ලිංගික ක්‍රියා නිර්අපරාධීකරණය කරන ලෙස එම කමිටුව විසින් ශ්‍රී ලංකා රජයට තරයේ පවසා ඇත.

2. ශ්‍රී ලංකාව සඳහා වූ 42වන යූ පී ආර් සැසියේදී ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, කැනඩාව, නෝර්වේ සහ නෙදර්ලන්තය ඇතුළු රටවල් 19ක් නිර්දේශ කර තිබුණේ කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියාවන් නිරඅපරාධීකරණය කිරීමටයි. [15] සිට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව එවැනි සබඳතා නිර්අපරාධීකරණය කරන ලෙස ඉල්ලා සිටි අතර, අවස්ථා කිහිපයකදී නිර්අපරාධීකරණය පිලිබඳ ධනාත්මක ප්‍රකාශ ඉදිරිපත්වුවත්, කිසිඳු ආකාරයක නිසි පියවර තවමත් ගෙන නැත.

3. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ සාමාජිකයින්ව, විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ව, හරස් විලාසිතා කරන ප්‍රජාව, සිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයට අදාළ සම්මතයන්ට නොගැලපෙන පෙනුමක් ඇති පුද්ගලයින්ව සහ වාණිජ ලිංගික ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන පුද්ගලයින්ව අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබාගැනීමට දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය, එනම්, වෙනත් පුද්ගලයකු ලෙස පෙනීසිටිමින් වංචා කිරීම, සහ 1941 අයාලේ යාමේ ආඥා පනත බහුල ලෙස භාවිත කරනු ලබයි.[16]

---

[13] 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහ සංශෝධනයේ 18 වන වගන්තිය මෙසේ පවසයි: ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ. "365අ. ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තකු සමග යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන, නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශවකරුවකු වන හෝ, එබඳු යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් කරනු ලැබීම කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඔහුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගතකිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද, ඒ වරද වයස අවුරුදු 18කට වැඩි තැනැත්තකු විසින් වයස අවුරුදු 16කට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් සිදුකරනු ලබන අවස්ථාවක, අවුරුදු 10කට නොඅඩු වූද අවුරුදු 20ක් නොඉක්මවන්නා වූද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය. තවද, ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන්ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙසද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය."

[14] සීඩෝ වාර්තාව: අංක 134/2018 සංදේශය සම්බන්ධයෙන් වෛකල්පිය මූලලේඛනයේ 7(3) වගන්තිය යටතේ කමිටුව අනුමත කළ අදහස්

[15] 42වන යූ පී ආර් සැසියේ ශ්‍රී ලංකාව සඳහා වන නිර්දේශ: https://uprmeetings.ohchr.org/Sessions/42/SriLanka/Pages/default.aspx

[16] එක්සත් ජනපදයේ ජනපද දෙපාර්තමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ කම්කරුවන් සඳහා වන කාර්යාංශය විසින් නිකුත් කළ, 2016 වසර සඳහා වන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිලිබඳ වාර්තාව: https://www.state.gov/wp-content/uploads/2019/01/Sri-Lanka-1.pdf


© ඉක්වලිටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

4. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය යටතේ ඇති 12(2) වගන්තිය පවසන්නේ ''කිසිම පුරවැසියකු ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ බේදය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට භාජනය නොවිය යුතු'' බව වන අතර, මෙම සාකච්ඡාව සඳහා එම හේතූන් 'වෙනස්කොට සැලකීමට හේතුවන හේතූන්' ලෙස සැලකිය හැකිය. එම වගන්තිය තුළ ''ස්ත්‍රී-පුරුෂභාවය'' සඳහන් කර තිබුනත්, ''ස්ත්‍රී-පුරුෂ සමාජභාවය'' හෝ ''ලිංගික දිශානතිය'' යන වචන හෝ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සහ අනෙකුත් ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා, ප්‍රකාශන සහ ලක්ෂණ යන කාණ්ඩවලට අයත් යැයි හඳුන්වාගන්නා පුද්ගලයින් පිළිබඳ පැහැදිලි සඳහනක් නොමැත.

5. මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තිය විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනුකිරීම අවහිර කරයි. ඒ, එම වගන්තිය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට හෝ අනෙකුත් ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදනවලට පටහැනි සියලුම පවතින නීතීන් වලංගු බවට පත් කරන බැවිනි. තවද, මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කළ හැක්කේ පරිපාලන හෝ විධායක ක්‍රියාවක් හේතුවෙන් සිදුවන අයිතීන් උල්ලංඝනය වීමකට විරුද්ධව පමණක් වන අතර, ඉන් පෞද්ගලික පාර්ශවයකට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කිරීම වැළකේ. පොදු සේවා සපයන සහ වෙනස්කොට සැලකීම්වලට හේතුවන පෞද්ගලික පාර්ශව ගණනාවක් රට තුළ ඇති හෙයින් මෙය ගැටළු ගණනාවක් මතු කරයි.

6. ''කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය,'' යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය පවසයි. 1994 අංක 22 පනත යටතේ වධහිංසාවලට හෝ අනෙකුත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්වලට හෝ දඬුවමවලට එරෙහි ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව ස්ථිර සහ බලාත්මක කොට ඇත.[17] කෙසේනමුත්, වධහිංසාවලට ලක්වීමෙන් තොරව ජීවත්වීමට ඇති මූලික අයිතිවාසිකම පවා උල්ලංඝනය කරමින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවට විරුද්ධව අකටයුතුකම් සිදුවේ. සම-ලිංගික ක්‍රියා සිදුවූවා යැයි ඔප්පු කිරීමට සාක්ෂි සැපයම සඳහා 2007 වර්ෂයේ සිට බලධාරීන් විසින් අඩුම තරමේ පුද්ගලයින් හත්දෙනෙකුවත් බලහත්කාරයෙන් කායික පරීක්ෂණවලට ලක්කර ඇති බව හෙළිකරමින්, 2020 ඔක්තෝබර් මස ඊක්වල් ග්‍රවුන්ඩ් සහ හියුමන් රයිට්ස් වොච් සංවිධාන වාර්තාවක් පලකරන ලදී. බලහත්කාරයෙන් සිදුකළ ගුදමාර්ග පරීක්ෂා සහ යෝනිමාර්ග පරීක්ෂාවක් මෙම පරීක්ෂණ අතර විය.[18] එමෙන්ම, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව තුළ පරිවර්තන චිකිත්සාව සිදුකිරීම පිලිබඳව වාර්තා ගණනාවක් ඇති අතර, ඒ අතර සංක්‍රාන්ති සමාජභාවී සහ විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා ඇති පුද්ගලයින් විශේෂ වේ.[19] විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානති මානසික රෝගවලට හේතුවක් යන මතය අනුමත නොකරන බවට ශ්‍රී ලංකා මනෝවෛද්‍යවරුන්ගේ සංගමය ප්‍රකාශයක් නිකුත්කොට ඇති අතර[20], තවද, කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියාකාරකම් නිර්අපරාධීකරණය කරන ලෙසත් ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වාදෙන ලෙසත් එම සංගමය රජයට තරයේ පවසා සිටින ලදී. කෙසේනමුත්, මෙම වෛද්‍ය වෘත්තිකයින් විසින් මෙම අකටයුතුකම්

---

[17] වධහිංසාවලට හෝ අනෙකුත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්වලට හෝ දඬුවමවලට එරෙහි ප්‍රඥප්තිය: http://citizenslanka.org/wp-content/uploads/2016/02/Convention-against-Torture-and-other-Cruel-Inhuman-or-Degration-Treatment-of-Punishment-Act-No-39-of-1994-E.pdf

[18] හියුමන් රයිට්ස් වොච් විසින් පලකළ "Sri Lanka: Forced Anal Exams in Homosexuality Prosecutions" - පළවූයේ 2020.10.20

https://www.hrw.org/news/2020/10/20/sri-lanka-forced-anal-exams-homosexuality-prosecutions

[19] ආසියා පැසිෆික් සංක්‍රාන්ති සමාජභාවී ජාලය (The Asia Pacific Transgender Network – APTN) විසින් රටවල්වල සිටින එහි හවුල්කරුවන් සමග පලකළ "For as long as you stay boxed within the binary, you are seen as staying in line": Conversion Therapy Practices in Sri Lanka https://www.aidsdatahub.org/sites/default/files/resource/conversion-therapy-2020-sri-lanka-country-snapshot.pdf

[20] ශ්‍රී ලංකා මනෝවෛද්‍යවරුන්ගේ සංගමයේ ප්‍රකාශය: https://www.fpasrilanka.org/content/fpasl-endorses-statement-made-sri-lanka-college-psychiatrists-regarding-human-sexuality-and


© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

තවමත් සිදුකරමින් පවතින අතර, එකී කරුණු සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපත්තිමය හෝ නියාමනමය පියවර තවමත් ගෙන නැත.

**7**. ශ්‍රී ලංකාව තුළ පුරුෂයකු 'දූෂණය' කිරීම යන ක්‍රියාව දූෂණය කිරීමට අදාළ සාමාන්‍ය නීති යටතේ හඳුනාගෙන නැත. මෙම කරුණ දණ්ඩ නීති සංග්‍රහයේ දරුණු ලිංගික අපයෝජන සම්බන්ධයෙන් පවතින **365**ආ සහ දූෂණය කිරීමට අදාළ දඬුවම් සම්බන්ධයෙන් පවතින **364** යටතේ ආවරණය වන නමුත්, සමාජය තුළ ඒවා ප්‍රමාණවත් තරම් බරපතල ලෙස සලකන්නේ නැත.

8. ස්ත්‍රී–පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකපත[21] හඳුන්වාදීම ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව වෙනුවෙන් ගත් ධනාත්මක පියවරකි. ඒ, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට සිය ස්ත්‍රී–පුරුෂ සමාජභාවය තහවුරුකිරීමේ ක්‍රියාවලිය තුළ පහසුවෙන් ඉදිරියට යාමට අවශ්‍ය සහාය ලබාදීමට ශ්‍රී ලංකාවේ වෛද්‍ය ප්‍රජාව රාජ්‍ය ආයතන සමග එක්වූ බැවිනි. අවාසනාවකට මෙන්, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සහ රාජ්‍ය නිලධාරීන් අතර මේ සම්බන්ධයෙන් පවතින දැනුම මදිකම සහ මෙම ක්‍රියාවලියේ විවිධ අවස්ථා ඒකාකාරී ලෙස පවත්වාගෙන යාමේ මදිකම මෙම ක්‍රියාවලියට බාධා එල්ල කොට ඇත.

9. **2005** වර්ෂයේදී හඳුන්වාදුන් ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතද[22] විවිධ ස්ත්‍රී–පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානති පිළිගන්නා ප්‍රගතිශීලී පියවරක් ලෙස නම්කළ හැකිය. මෙම පනත තුළ 'සහවාසකරන සහකරුවා' යන වචනය ඇතුළත් වන අතර, එය ස්ත්‍රී–පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් මධ්‍යස්ථ වචනයකි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණපෑ අවස්ථාවක අවශ්‍යනම් පොලිසිය හමුවේ පැමිණිලි කිරීමට ප්‍රජා සාමාජිකයින්ට මෙම පනත ඉඩකඩ ලබාදෙන මුත්, කැමැත්තෙන් ඇතිවන සම-ලිංගික සම්බන්ධතා අපරාධීකරණය කර තිබීම සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට වින්දිතයින් ලෙස ලැබී ඇති හඳුනාගැනීම හේතුවෙන්, පුද්ගලයින් පැමිණිලි කිරීමට මැලිකමක් දක්වයි.

[21] ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකපත සම්බන්ධයෙන් නිකුත් කළ චක්‍රලේඛය: චක්‍රලේඛ අංක 01/34/2016
[22] 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත: https://www.refworld.org/pdfid/4c03ba2f2.pdf



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 4 : සොයාගැනීම්

**පිළිගැනීම හරහා අසමානතාව වැඩිවී ඇත**

1. ශ්‍රී ලංකාව තුළ, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් ''සමානාත්මතාවය'' දිනාගැනීම යන මාතෘකාව දිගටම පවත්නා, සංකීර්ණ ගැටලුවකි. ප්‍රජා සාමාජිකයින් සමග පැවැත්වූ සාකච්ඡාවලදී ප්‍රකාශ වූයේ, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින් වෙනස්කොට සැලකීම්වලට, ආන්තිකකරණයට සහ ප්‍රචණ්ඩත්වයට විවිධ මට්ටම්වලින් මුහුණපාන බවයි. සම-ලිංගික ක්‍රියා අපරාධීකරණය කර තිබීම මෙන්ම, දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය හා අයාලේ යාමේ ආඥා පනතේ ඇතුළත් ප්‍රතිපාදන වැනි අනෙකුත් වෙනස්කොට සැලකීම්වලට මගපාදන නීති හරහා සිදුවන නීතිය මත පදනම් වූ වෙනස්කොට සැලකීම්, සෞඛ්‍ය සහ අනෙකුත් සේවා ලබාගැනීමේදී පවතින අසමාන සැලකීම්, සහ කොන් කිරීම, හිංසා කිරීම සහ වෛරීය අපරාධ වැනි සමාජයය වෙනස්කොට සැලකීම්, මීට ඇතුළත් වේ.

2. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජා සාමාජිකයින් තර්ක කළේ, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය කුමක් වුවත් සියලු පුද්ගලයින්ට අනෙකුත් සියලු දෙනාටම ඇති අයිතීන් සහ ආරක්ෂාව තිබිය යුතු බවයි. විවාහ වීමට, දරුවන් හදාගැනීමට, වෙනස්කොට සැලකීමට සහ හිංසාවට බියවීමකින් තොරව සෞඛ්‍ය සහ අධ්‍යාපන අවස්ථා ලබාගැනීමට, සහ වෛරීය අපරාධ හා අනෙකුත් ආකාරවල ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ආරක්ෂාවීමට ඇති අයිතීන් මීට ඇතුළත් ය.

*''අපිත් මේ රටේ පුරවැසියෝ. ඒ වගේම අපිත් මිනිස්සු. අපිටත් අවශ්‍ය අනිත් හැමෝටම අවශ්‍ය දේවල්. අපි එකම විදියට කනව නම්, ජීවත් වෙනව නම් සහ අනිත් හැමදේම එකම විදියට කරනවා නම්, අපි කවුරු එක්කද ඉන්න ඕන, අපි කාටද ආදරේ කරන්න ඕන කියල කියන්න අපිට වෙනම නීති අවශ්‍ය ඇයි.''*

– නිපුන්, අවුරුදු 37යි, ගාල්ලේ වෙසෙන සමරිසි පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

*''විෂමරිසි පුද්ගලයින්ගේ ලිංගික චර්යාවට විරුද්ධව වෙනම නීති නැති නිසා, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවගේ ලිංගික ක්‍රියා හෝ වෙනත් දෙයක් පාලනය කරන්න වෙනස් නීති තිබීම වැරදියි.''*

– අශේන්, අවුරුදු 28යි, අනුරාධපුරයේ වෙසෙන සමරිසි පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

3. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව විවිධ ආකාරවල වෙනස්කොට සැලකීම්, සම අවස්ථා අඩුකම, සීමා සහිත නීතිමය ආරක්ෂාව, සමාජයය වෙන්කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය ආදියට මුහුණපායි. රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, පොදු සේවා ආදී අංශ ගණනාවක් තුළ ප්‍රජාවට සම අවස්ථා ලබාදීම ප්‍රතික්ෂේප වී ඇත. සිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය වසන් කරන පුද්ගලයින් සමග සංසන්දනය කළ විට, විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා, ප්‍රකාශන සහ ලිංගික දිශානති තුළ කැපීපෙනෙන පුද්ගලයින් ඉහත සඳහන් කල පසුබිම් තුළ වැඩියෙන් වෙනස්කොට සැලකීම්වලට මුහුණපාන බවද ඉස්මතු විය.

*''මගේ ජීවිතේ වැඩි කොටසක් මම ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය/ප්‍රකාශනය හෝ ලිංගික දිශානතිය හංගගෙන හිටිය නිසා, මේ රටේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජා සාමාජිකයින් මුහුණපාන දේවල්වලින් වැඩි කොටසක් මම කවදාවත් අත්විඳලා නැහැ. මම ගොඩක් ආසයි දවසක ගවුමක් ඇඳලා අනිත් අය හිතන දේ හෝ හිංසනවලට බය වෙන්නේ නැතුව පාරක ඇවිදින්න. මම දන්නේ නැහැ ඒ දේ කරන්න කවදහරි මට ධෛර්ය ලැබෙයිද කියල.''*

– ප්‍රනාන්දු, අවුරුදු 37යි, පුත්තලමේ වෙසෙන ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිශ්චිත නොමැති අයෙකු ලෙස තමන්ව හඳුන්වාගනී.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

**4**. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් සමානාත්මතාවය ළඟාකර ගැනීමේදී අවශ්‍ය වන වෙනස්කම් නීතිමය සහ ප්‍රතිපත්තිමය වෙනස්කම්වලට සීමා නොවේ. ඒ සඳහා, සමාජයය ආකල්පවල සහ සම්මතවල වෙනසක්ද අවශ්‍ය වේ. කෙසේනමුත්, අයි සී සී පී ආර් ප්‍රඥප්තිය යටතේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවට ලැබිය යුතු අයිතීන් ගණනාවක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට පවතින නීතී හේතුවක් කරගෙන ඇති අතර, ඒවා සමාජය තුළ ව්‍යාප්තව පවතින වෙනස්කොට සැලකීම්වලට මුහුණපාන ලිංගික සුළුතරය තවදුරටත් කොන් කිරීම අනුමත කරයි.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 5 : අධ්‍යාපනය

1. අධ්‍යාපනය ලබාගැනීමේදී සහ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සමාන අවස්ථා ලබාගැනීමේදී විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ සාමාජිකයින් විශාල බාධාවලට මුහුණපායි. වෙනස්කොට සැලකීම්, හිංසාකාරී ක්‍රියා, සහ සියලුම මට්ටම්වල අධ්‍යාපන ආයතනවලින් කොන් කිරීම අධ්‍යන කටයුතුවල සාර්ථකත්වයට සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජා ශිෂ්‍යයින්ගේ මානසික සෞඛ්‍යට බලපෑම් ඇතිකළ හැකිය. විවිධත්වය සහ පිළිගැනීම ප්‍රචලිත කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් හරහා ඇතැම් අධ්‍යාපන ආයතන සහ අධ්‍යාපකයින් මෙම ගැටළු විසඳීමට පටන් ගෙන ඇති මුත්, ලිංගික දිශානතිය, ප්‍රකාශනය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නොසලකා සියලුම ශිෂ්‍යයින්ට ආරක්ෂාකාරී සහ සහයෝගයක් ලැබෙන පරිසරයක ඉගෙනීමට සහ සාර්ථක වීමට අවස්ථාව ඇති බව තහවුරු කිරීමට මහත් වූ වැඩ කොටසක් සිදුකිරීමට ඇත.

2. මෙම අධ්‍යනයට සහභාගීවූවන්ගෙන් 54%ක් පැවසුවේ 2018-2022 කාල පරිච්ඡේදයේදී ඔවුන්ට අධ්‍යාපන ආයතන තුළ සම අවස්ථා ලබාදීම ප්‍රතික්ෂේප වී ඇති බවයි. සහභාගීවූවන් තවදුරටත් පැවසුවේ ඔවුන්ව අධ්‍යාපන ආයතනවලට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප වී ඇති බවත්, ඇතැම් අවස්ථාවලදී ඔවුන් කැමැති විෂයන් හෝ විෂයබාහිර ක්‍රියාකාරකම් තෝරාගැනීමේදී කොන්කිරීමට හෝ ප්‍රතික්ෂේප වීමට ලක්ව ඇති බවත්ය. මේ හේතුවෙන්, සහභාගීවූවන්ගෙන් 22.2%ක් පමණ අධ්‍යන කටයුතු අතරමග නවත්වා දැමීම හෝ අදාල අධ්‍යාපන ආයතනවලින් ඉවත් වීම සිදුකර ඇත.

*"2018 දී උසස් පෙළ විෂයන් වලට මම නර්තනය සහ ගෘහ විද්‍යාව තෝරගත්තා. මගේ පාසලේ ගුරුවරු සහ අනිත් සිසුන් මට විහිළු කළා සහ නම් පටබැන්දා. ඒ කාලේ මම හිටියෙ ලොකු පීඩනයකින්. පාසලේදී සිද්දවෙච්ච හිංසා නොසලකා මම අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන ගියා. මගේ අරමුණ වුනේ ඒ විෂයන්වලින් හොඳ ප්‍රතිපල ලබාගන්න. අවසානයේදී සාර්ථක වෙන්න තරම් මම වාසනාවන්ත වුනත්, මම දැකල තියෙනවා හිංසාවට ලක්වීමේ වේදනාව තවදුරටත් දරාගන්න බැරි නිසාම සහෝදර ශිෂ්‍යයින් පාසල අතහැරලා යනවා."*

- පසන්, අවුරුදු 21යි, කෑගල්ලේ වෙසෙන සමරිසි පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

3. සහභාගී වුවන්ගෙන් 70%කට වඩා විවිධ ලිංගික දිශානති, ප්‍රකාශන හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා හේතුවෙන් අවස්ථා ගණනාවකදී ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක්ව ඇති බව පැවසූ අතර, ප්‍රජා සාමාජිකයින් සමග පැවැත්වූ සාකච්ඡාවලදී අවධාරණය වුයේ, සිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය අධ්‍යාපන ආයතන තුළ හෙළිකොට නොමැති හෝ ඒ පිළිබඳව විවෘත නොමැති ප්‍රජා සාමාජිකයින්ට වඩා ඒවා පිලිබඳ වඩාත් විවෘත පුද්ගලයින් හිංසනයට ලක්ව ඇති බවයි.

*"මට පාසල හැරයාමේ සහතිකය ලැබෙන්න තිබුණේ 2018 වසරේදී. නමුත් මට තවමත් ඒක ලැබුනෙ නැහැ. හේතුව තමයි, ඒක නිකුත් කරන ක්‍රියාවලිය භාරව හිටපු ගුරුවරයා මම සංක්‍රාන්ති ක්‍රියාවලිය පටන් අරගෙන තිබුන නිසා මට ඒ සහතිකය දෙන එක ප්‍රතික්ෂේප කිරීම. ගුරුවරු සහ ශිෂ්‍යයෝ දෙගොල්ලොම ඉන්න වට්ස්ඇප් කණ්ඩායමක මාව විහිළුවට ලක්කරා. මටයි මගේ සහකරුටයි විශාල විදියට අපහාස විඳ දරාගන්න සිද්දවුනා. ඒක වේදනාකාරී අත්දැකීමක්.*

- සසිත්, අවුරුදු 24යි, රත්නපුරයේ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

4. තවද, සහභාගී වුවන්ගෙන් 40%ක් පමණ අධ්‍යාපනය සම්බන්ධ පරිසරවලදී මානසික හිංසනයට ලක්වූ බවත්, 33%ක් පමණ අධ්‍යාපන ආයතන තුළ වාචික හිංසනයට ලක්වූ බවත්, පවසන ලදී.

*"මම රජයේ පාසලක උසස් පෙළ හදාරමින් හිටපු කාලයේදී මගේ පන්තියේ ශිෂ්‍යයෙක් ප්‍රංශ භාෂාව උගන්නපු ගුරුවරයාට කිව්වා මම සමරිසි පිරිමින් එක්ක කාලය ගත කරනවා කියල. ප්‍රංශ ගුරුවරයා මට පන්තිය මැද්දේ හිටගන්න*



© ඉක්වල් ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

*කියල, මගේ පන්තියේ ශිෂ්‍යයින් ඉදිරිපිටදීම මගෙන් ඒ ගැන ඇහුව. ඊළඟට ඇය මට කිව්වා සමරිසි පිරිමින් ලෙඩ පතුරවන නිසා ඔවුන්ව ආශ්‍රය කරන්න එපා කියල. මට ලොකු අපහසුවක් දැනුනා. හිරිහැර වඩාත් නරක අතට හැරිච්චි නිසා මම පාසලට යන එක නැවැත්තුවා. මට මගේ උසස් පෙළ පවා මගහරින්න සිද්දවුනා, මොකද මට තිබ්බ විශාදය තත්වය නිසා මට ඉගෙනීම් කටයුතු ගැන අවධානය යොමු කරන්න බැරිවුනා. මට දැනුනේ මගේ ප්‍රතිරූපයට සහ මගේ පෞරුෂයට හානිවුනා කියල.''*

- අශේන්, අවුරුදු 20යි, කොට්ටාවේ වෙසෙන සමරිසි පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

5. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජා සාමාජිකයින්ට අධ්‍යාපනික පරිසරයක් තුළ එවැනි ගැටළු පිලිබඳව පැමිණිලි කිරීමට තරම් ආරක්ෂාකාරී බවක් දැනුනාදැයි සාකච්ජා කරමින්, සහභාගී වුවන් පෙන්වාදුන්නේ ලිංගික දිශානති, ප්‍රකාශන හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා පිලිබඳ සාකච්ජා කිරීම අනුමත නොකරන බැවින්, එවැනි ගැටළු බලධාරීන්ට වාර්තා කොට කිසිඳු වාසිදායක ප්‍රතිඵලයක් ලබාගැනීමට හැකිවේ දැයි ඔවුන්ට විශ්වාසයක් නොතිබුණු බවයි. ඔවුන් තවදුරටත් පැවසුවේ වගකිවයුතු බලධාරීන්ගෙන් බහුතරයක් සමරිසි භීතික සහ සංක්‍රාන්ති සමාජභාවී භීතික බවක් පෙන්වූ බැවින්, එවැනි ගැටළු පිලිබඳව පැමිණිලි කිරීමට මැලිකමක් ඇතිවූ බවයි. ඒ, එම තත්වය තුළ, හිංසනවලට වගකිවයුතු පාර්ශ්වය වෙනුවට පැමිණිල්ල ඉදිරිපත් කරන විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජා සාමාජිකයාට තවත් ගැටළුවලට මුහුණපෑමට සිදුවිය හැකි බැවිනි.

*''ශිෂ්‍ය නායක මණ්ඩලයට අයදුම් කරන්න මට ඉඩදුන්නේ නැහැ. ජ්‍යෙෂ්ඨ කමිටු සාමාජිකයින් මගේ අයදුම්පත පිළිගත්තේ නැහැ. මට හොඳ ශ්‍රේණිගත කිරීම් තිබ්බා වගේම මම පාසලේ විෂය බාහිර ක්‍රියාකාරකම්වලටත් සම්බන්ධ වෙලා හිටියා. මම ජ්‍යෙෂ්ඨයින්ගේ ඇහුවම මගේ අයදුම්පත බාරගන්න බැරි ඇයි කියල, ඔවුන් කිව්වේ මගේ ලිංගික නැඹුරුතාවය ගැන කටකතා අහන්න ලැබුණා සහ මම ඊළඟ කමිටුවේ සාමාජිකයෙක් වෙනවට අපේ (පාසලේ) නිවාසය බාර ගුරුවරයා පවා අකමැතියි කියල. ඒ කාලයේ මම මගේ ලිංගික දිශානතිය ගැන තවදුරටත් සොයාබලමින් සිටියේ. ඒ වගේම, ඒ ගැන මම සම්පූර්ණයෙන්ම පාසලට හෙළිකරලා තිබ්බෙත් නැහැ. මම ඒ ගැන කතාකරල තිබ්බේ මනෝ උපදේශනය දෙන ගුරුවරයා එක්ක විතරයි. පස්සෙ මට දැනගන්න ලැබුනේ මම ගැන අදාළ කටකතා පතුරවල තිබුනේ ඒ ගුරුවරය කියලයි. ගුරුවරුන් ඉන්නෙ ළමයින්ව ආරක්ෂා කරන්න. ඒගොල්ලෝ එහෙම හැසිරෙද්දී අපි කොහේටද පැමිණිලි කරන්නේ? මට කියන්න තිබ්බ දේට ඇහුම්කම් දෙන්න සූදානම් කවුරුත් නැහැ. පාසලේ අවසාන අවුරුදු දෙකේදී මට කිසිම වටිනාකමක් ඇති කෙනෙක් කියල දැනුනේ නැහැ.''*

- නෙත්මි, අවරුදු 21යි, නුවර වෙසෙන කුයර ස්ත්‍රියක් ලෙස තමන්ව හඳුන්වාගනී




© ඉක්වලිටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 6 : රැකියා නියුක්තිය

1. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ලෙස හඳුනාගන්නා පුද්ගලයින්ට එරෙහි සිදුවන වෙනස්කොට සැලකීම් ශ්‍රී ලංකාව තුළ තවමත් දැකිය හැකි යතාර්ථයක්. වාචික හිංසන, සේවා ස්ථානයේ ක්‍රියාකාරකම් හෝ අවස්ථාවලින් කොන්කිරීම, සහ රැකියාවට බඳවා ගැනීමේදී, උසස්වීම් ලබාදීමේදී හෝ සේවාවෙන් ඉවත් කිරීමේදී අසමාන සැලකිලි ලැබීම ආදී බරපතල රැකියා සම්බන්ධ අභියෝග සහ වෙනස්කොට සැලකීම් වලට ඔවුන් මුහුණපායි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුණු තුළද රැකියා ලෝකයේ සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම අඩංගු කර ඇත. [23] ශ්‍රී ලංකාව තවමත් එම සංවිධානයේ 190 ප්‍රඥප්තිය ස්ථිර සහ බලාත්මක කර, සේවා ස්ථානය තුළ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර මුලිනුපුටා දැමීමට පියවර ගෙන නොමැත.[24]

2. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් පවතින නීතිමය ආරක්ෂාව මදිකම ද විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පුද්ගලයින්ට වෙනස්කොට සැලකීම් හෝ හිංසාකාරී ක්‍රියාවලට බිය නොවී රැකියා අවස්ථා සොයා යාමට ඇති හැකියාවට බාධාවකි. ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය මත පදනම්ව රැකියාවේදී සිදුවන වෙනස්කොට සැලකීම් තහනම් කරන විශේෂ නීති නොමැති අතර, එවැනි ක්‍රියා වැළක්වීමට නීතිමය රැකවරණයක් ද නොමැත. උපදේශන සාකච්ජාවලදී සාකච්ජා වූ පරිදි, බොහොමයක් පුද්ගලයින් තම ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය, ප්‍රකාශනය හෝ ලිංගික දිශානතිය සේවා ස්ථානයේදී සඟවාගෙන සිටීමට මූලික හේතුව වන්නේ මෙම තත්වයයි. එසේම, රැකියාවට බඳවා ගැනීමේදී, උසස්වීම් ලබාදීමේදී, සහ වෙනත් රැකියා සම්බන්ධ තීරණ ගැනීමේදී මුහුණපාන වෙනස්කොට සැලකීම් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජා සාමාජිකයින්ව බරපතල මූල්‍යමය සහ වෘත්තීමය වශයෙන් අවාසිදායක තත්වයන්ට නිරාවරණ කරයි.




[23] "එල් ජී බී ටී සේවකයින් සේවා ස්ථානයේදී සම අයිතීන්වලට සහ සම ප්‍රතිලාබවලට හිමිකම් කියයි" යනුවෙන් අයි එල් ඕ පවසයි https://www.ilo.org/global/about-the-ilo/how-the-ilo-works/ilo-director-general/statements-and-speeches/WCMS_368652/lang--en/index.htm

[24] අයි එල් ඕ 190 ප්‍රඥප්තිය: https://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

*''මම කැලණියේ තියෙන සමාගමකට රැකියාවකට ගියා. ඒ වෙනකොට මගේ ජාතික හැඳුනුම්පත වෙනස්කරල තිබ්බෙත් නැහැ. මම මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට මේ ගැන කිව්වා. වැඩ කරන තැන මගේ පළවෙනි දවසෙම මගේ ජාතික හැඳුනුම්පත සේවා ස්ථානයට ඇතුල්වෙන තැන හිටපු ආරක්ෂක නිලධාරීන් ඉල්ලගත්ත, සහ ඒගොල්ලෝ මට කිව්වා මගේ සේවා මුරය ඉවර වෙලා එක අපහු ඉල්ලගන්න කියල. මම මගේ ජාතික හැඳුනුම්පත ඉල්ලගන්න ගිය වෙලාවේදී මගේ පෙනුම සහ ජාතික හැඳුනුම්පතේ ඡායාරූපය වෙනස් නිසා ආරක්ෂක නිලධාරීන් කිව්වා මගේ ජාතික හැඳුනුම්පත දෙන්න බැහැ කියල. මම මේ ප්‍රශ්නය විසඳගන්න උත්සාහ කරමින් ඉඳිද්දී මානව සම්පත් අංශයෙන් මට එන්න කියල එවපු පණිවිඩයක් ලැබුන. මානව සම්පත් අංශය මට කිව්ව මම කරපු වැඩවලට වැටුප් ගෙවනව, නමුත් මාව සේවයෙන් ඉවත් කරනවා කියල. මම ඒකට හේතු ඇහුවම කිව්වේ පාවිච්චි කරන්නේ මොන වැසිකිළියද කියලවත් තහවුරු කරගන්න බැරි පුද්ගලයෙක්ව රැකියාවට බඳවාගන්න බැහැ කියල.''*

- අසේල, අවුරුදු 28යි, ගම්පහ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙකු ලෙස තමන්ව හඳුන්වාගනී.

**3**. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජා සාමාජිකයින්ගෙන් බහුතරයක් (අධ්‍යනයට සහභාගී වූ අයගෙන් 58%ක් පමණ) අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියාවේ නියුතු බව මෙම අධ්‍යනය හරහා ඉස්මතු විය. ඔවුන් පැවසුවේ ඔවුන්ට සේවා ස්ථානවලදී පහසුවක් නොදැනෙන බවත්, එනිසා ඔවුන් ස්වයංරැකියාවක නියැලීමට හෝ ඔවුන්ගේ පවුලට, ඥාතියෙක්ට හෝ වෙනත් ප්‍රජා සාමාජිකයෙක්ට අයිති ස්ථානයක රැකියාවක් කිරීමට වඩාත් කැමති බවයි. මෙම කරුණු හේතුවෙන්, ප්‍රජා සාමාජිකයින්ගෙන් ප්‍රමාණවත් තරම් දෙනෙක් රැකියා නොකරන බව හෝ සිය සුදුසුකම්වලට නොගැළපෙන රැකියා කරන බවත් පැහැදිලි විය.

*''මට තියෙන්නේ කාන්තා ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රකාශනයක් වීම වගේම මම දෙමළ වීම මගේ සුදුසුකම්වලට ගැලපෙන රැකියාවක් හොයද්දී මාව අවාසිදායක තත්වයකට පත්කරලා තියෙනවා. මාව ව්‍යාපාර කරන සමාගම් කිහිපයකින්ම ප්‍රතික්ෂේප වුනා. මට ආදායම් මාර්ගයක් අවශ්‍ය වුන නිසා මම අන්තිමට අලෙවි නිලධාරියෙක් විදියට සමාගමකට සම්බන්ධ වුනා. නමුත් මගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රකාශනය නිසා මට එතන මාස දෙකකට වඩා රැකියාව කරන්න බැරි වුනා. දැන් මම යාපනයේ කුයර සංවිධාන සමග ස්වේච්ඡාවෙන් වැඩ කරනවා. කොහොම වුනත්, මට නිසි ආදායම් මාර්ගයක් අවශ්‍යයි.''*

- සතීෂ්, අවුරුදු 28යි, යාපනයේ වෙසෙන ඇන්ඩ්‍රොජීනි (ලිංගික වශයෙන් ස්ත්‍රී සහ පුරුෂ අතර යැයි හඳුනාගන්නා) පුද්ගලයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

**4**. විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින් සේවා ස්ථාන තුළ පවා වෙනස්කොට සැලකීම්, හිංසාකාරී ක්‍රියා සහ තර්ජනය කිරීම්වලට ලක්වේ. මේවා හේතුවෙන් සේවා ස්ථානය තුළ සේවය කිරීමට අපහසු පරිසරයක් නිර්මාණය විය හැකි අතර, එය ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සහ රැකියාවේ ඵලදායිතාවය මත සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකිය. සමීක්ෂණයට සහභාගිවූ අයගෙන් 41%ක් පැවසුවේ මෙවැනි හිංසාකාරී ක්‍රියා සිදුකළේ ඔවුන්ට සෘජුවම ඉහළින් සිටින වැඩ පරීක්ෂකවරයා හෝ වාර්තා කළ යුතු ඉහළ නිලධාරියා බවයි. ඊට අමතරව, සමීක්ෂණයට සහභාගී වූ විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ගෙන් 30%ක් පැවසුවේ, ඔවුන් සමග රැකියාව කරන පුද්ගලයින් අතර පවතින කොන්කිරීම් සහ වැරදි මතවාද ද විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින් සේවා ස්ථානයේ ක්‍රියාකාරකම් සහ උත්සව වලින් වෙන්වී සිටීමට සහ හුදකලාවී සිටීමට හේතුවන බවයි.

*''මට කෙලින්ම ඉහළින් ඉන්න වැඩ පරීක්ෂකවරයා කරන නුසුදුසු ලිංගික යෝජනා මං දිගින් දිගටම මඟැරියා. නමුත්, වැඩ වගයක් ඉවර කරන්න අවශ්‍යයි කියල එක දවසක් එයා මට කාර්යාල වේලාවෙන් පස්සේ ඉන්න කිව්වා. අනිත් හැමෝම වැඩ ඉවර කරනකම් මාව තියාගත්තා, සහ බලෙන් ලිංගිකව හැසිරෙන්න උත්සාහ කළා. මගේ ලිංගික නැඹුරුතාවය ගැන අනිත් සේවකයින් දැනගන්නවට මම අකමැති නිසා ඒ සිද්ධිය ගැන මොනවා කරන්නද, කොහෙට පැමිණිලි කරන්නද කියල මම දැනගෙන හිටියෙ නැහැ.''*

- චමෝද්, අවුරුදු 33යි, කැලණියේ වෙසෙන සමරිසි පුරුෂයකු ලෙස තමන්ව හඳුන්වාගනී.



© ඉක්වලිටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

5. සේවා ස්ථානයේදී මුහුණ පෑ ප්‍රචණ්ඩකාරී ක්‍රියා හේතුවෙන් සහභාගී වූවන්ගෙන් 42%ක් පමණ කාංසාව අත්වින්ද ඇති අතර, සහභාගීවූවන්ගෙන් 92%ක් සඳහන් කළේ ඔවුන් සේවා ස්ථානයේදී කිසියම් ආකාරයක මානසික හිංසනයකට ලක්ව ඇති බවයි. ඔවුන්ට අනුව, සිය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික නැඹුරුතාවය සේවා ස්ථානයේදී හෙළිකිරීමෙන් ඔවුන් වැළකී සිටින්නේ ඒ හේතුවෙන් රැකියාව අහිමිවිය හැකි බැවිනි.

*''ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික නැඹුරුතාවය එළිනොකර ඉඳීමේ වඩාත්ම දුක කරුණ තමයි අනිත් අය කරන සියලුම සමරිසි භීතික විහිළුවලට හිනාවෙන්න සිද්ධවීම. මුලින් මට ඒ ගැන ඒ තරම් හිතුනේ නැහැ, මම හිනාවුනේ මාත් එක්ක වැඩ කරන අයට එකතු වෙන්න. නමුත් දැන් මට ඒව එපා වෙලා තියෙන්නේ.''*

– හසිනි, අවුරුදු 39යි, නුගේගොඩ වෙසෙන සමරිසි ස්ත්‍රියක් ලෙස තමන්ව හඳුන්වාගනී



© ඉක්වල් ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 7 : අත්‍යාවශ්‍ය සේවා ලබාගැනීම

1. සමාජය තුළ කොන්කිරීම සහ වෙනස්කොට සැලකීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ට අත්‍යාවශ්‍ය සේවා ලබාගැනීම අභියෝගාත්මක විය හැකිය. සෞඛ්‍ය සේවා ලබාගනීම සම්බන්ධයෙන් ඔවුන් විශාල අභියෝගවලට මුහුණපාන අතර, සෞඛ්‍ය සේවය තුළ ප්‍රජාව පිලිබඳ අවබෝධයේ මදිකමක්ද පවතී.

*''මගේ යාලුවෙක් ටෙස්ටොස්ටෙරෝන් ගන්න ගිය වෙලාවක ඔහුගේ පෞද්ගලික අවයව පෙන්නන්න කියල වෛද්‍යවරයා කියලා තියෙනවා. ඒ වෙලාවේ මගේ යාලුවා තදින්ම ඒකට විරුද්ධ වෙලා තියෙනවා. නමුත් ඒ සිද්ධිය නිසා මගේ යාලුවා බය වුනා, සහ එයා ඉන්නෙ ලොකු මානසික අපහසුතාවකින්.''*

– අකාෂ්, අවුරුදු 28යි, හෝමාගම වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙක් ලෙස තමන්ව හඳුන්වාගනී.

2. සාකච්ඡා හරහා හෙළිවුණු කරුණු අනුව සහ සමීක්ෂණයට ලැබුණු ප්‍රතිචාර අනුව, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාවට සුවිශේෂී වූ සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව හෝ ප්‍රමාණවත් දැනුම සෞඛ්‍යසේවා සපයන්නන්ට නොමැත. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් පවතින සෞඛ්‍ය අසමානතාවන් වඩාත් නරක අතට හරවමින්, මෙම තත්වය හේතුවෙන් නිසි සාත්තු කිරීම්වල අඩුකමක් සහ සෞඛ්‍යසේවා ලබාගැනීම සම්බන්ධයෙන් පසුබෑමක් ඇතිවිය හැකිය.

3. මීට අමතරව, සහභාගී වුවන් පැවසූ පරිදි, සම-ලිංගික සබඳතා අපරාධීකරණය වැනි නීතිමය බාධා විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ව ඇතැම් සෞඛ්‍යසේවා ලබාගැනීමෙන් වළක්වා ඇත. ඔවුන්ට අනුව, මෙම නීතිමය බාධා සේවා ලබාගැනීමේදී විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ව අධෛර්යමත් කරයි.

*''මගේ ලිංගික දිශානතිය නිසා තවදුරටත් සෞඛ්‍ය සේවා ලබාගන්න පුලුවන්ද කියල මට විශ්වාසයක් නැහැ. එකපාරක් ගම්පහ-මීගමුව ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සායනයේ වෛද්‍යවරයා මට බැන්නා මම පො***ක් කියල, සහ මම දිගටම සමරිසි වුනොත් මට එච් අයි වී හැදෙයි කියල. වෛද්‍යවරුන්ගෙන් හිරිහැර විඳින්න මට ඕන නැහැ. මම ඒ සායනයට ආපහු ගියොත් මගේ අනන්‍යතාවය එළිවෙයි කියල මට බයයි.''*

– ප්‍රභාත්, අවුරුදු 28යි, ගම්පහ වෙසෙන සමරිසි පුරුෂයෙක් ලෙස තමන්ව හඳුන්වාගනී.

4. ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පොදු ප්‍රවාහන සේවා භාවිතකිරීමේදී පවා අභියෝගවලට මුහුණදෙන බව සමීක්ෂණයට සහභාගී වූ පිරිස පවසන ලදී. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැලකීම් සහ හිංසාකාරී ක්‍රියා පොදු ප්‍රවාහන සේවා ඇතුළු සමාජයේ විවිධ වූ පැතිකඩවල ව්‍යාප්තව පවතී.

5. සාම්ප්‍රදායික සමාජ සම්මතවලට අනුගත නොවීම හේතුවෙන් පොදු ප්‍රවාහන සේවා භාවිතයේදී විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් අපහසුතාවන්ට මුහුණ දිය හැකි අතර, ඔවුන් අනෙකුත් මගීන්ගෙන් වෙනස්කොට සැලකීම්වලට සහ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලට ලක්විය හැකිය. මේ හේතුවෙන් ඔවුන්ට ඇති ආරක්ෂාකාරී සහ විශ්වාස කළ හැකි ප්‍රවාහන මාධ්‍යවල අඩුවක් නිර්මාණය වන අතර, ඒ හරහා රැකියා, අධ්‍යාපන සහ අනෙකුත් අවස්ථා ලබාගැනීම ද සීමා විය හැකිය.

*''අපි බස් එකකට ගොඩවුනහම ඇතුළේ ඉන්න මිනිස්සු අපි දිහා බලන්නේ අපි ප්‍රදර්ශනය කරන සත්තු වගේ. ඒගොල්ලෝ අපිට හිනහවෙන කතා කියනවා, සහ ඊළඟට වාඩිවෙලා ඉන්න කෙනාටත් අපිව පෙන්නලා අපේ පෙනුම ගැන මොනවහරි කියල හිනාවෙනවා. සමහර අවස්ථාවලදී අපි ගෑණුද පිරිමිද කියල අඳුනගන්න බැහැ කියල කෑගහනවා.''*

– නිසල්, අවුරුදු 42යි, පැලියගොඩ නච්චි ප්‍රජාවේ සාමාජිකයකු ලෙස තමන්ව හඳුන්වාගනී.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

6. ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට සමාජ ප්‍රතිලාභ ලබාදීම ප්‍රතික්ෂේප කිරීම විවිධ වූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානති සහිත පුද්ගලයින් මුහුණපාන තවත් ප්‍රධාන ගැටළුවක් ලෙස ඉස්මතු විය. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහි වෙනස්කොට සැලකීම් ව්‍යාප්තව පවතින අතර, මෙම තත්වය සමාජ ප්‍රතිලාභ සහ උපකාරක සේවා ලබාගන්නා පුද්ගලයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩුවීමට හේතුවිය හැකිය.

7. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ නීතිය සම-ලිංගික විවාහ පිළිගන්නේ නැති අතර, එම තත්වය තුළ විෂම ලිංගික යුවලවල් භුක්ති විඳින උරුමය සම්බන්ධ අයිතීන්, සෞඛ්‍යසේවා සම්බන්ධ ප්‍රතිලාභ ලබාගැනීම, සහ විශ්‍රාම ප්‍රතිලාභ වැනි සමාජ ප්‍රතිලාභ එආකාරයෙන්ම සම-ලිංගික යුවලවල්වලට භුක්ති විඳිය නොහැක.

8. සහභාගීවූවන් තවදුරටත් පෙන්වාදුන්නේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හෝ ප්‍රකාශනය මත පදනම්ව සේවා ස්ථානයේදී සිදුවන වෙනස්කොට සැලකීම් හේතුවෙන් සෞඛ්‍ය රක්ෂණාවරණ, විශ්‍රාම ප්‍රතිලාභ සහ අනෙකුත් ආකාරවල සමාජ ප්‍රතිලාභ ලබාදීම ප්‍රතික්ෂේප විය හැකි බවයි.

9. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් පවතින අවම නීතිමය පිළිගැනීම සහ රැකවරණය නිවාස ආධාර, ආහාර ආධාර සහ අධ්‍යාපනය සඳහා වන ශිෂ්‍යත්ව වැනි රජය විසින් සපයන සමාජ වැඩසටහන්වල ප්‍රතිලාභ ලබාගැනීමට ඇති හැකියාව අඩුවීමටද හේතුවිය හැකිය. තවද, මෙම තත්වය ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව සම්බන්ධයෙන් දරිද්‍රතාවයේ සහ ආන්තකකරණයේ චක්‍රයක් නිර්මාණය කල හැකිය.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 8 : පොලිස් ප්‍රචණ්ඩත්වය

1. පොලිසිය විසින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය යොදාගැනීම ශ්‍රී ලංකාව තුළ පවතින බරපතල ගැටලුවකි. රට තුළ සිටින විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජාව දීර්ඝ කාලයක් පුරාවට වෙනස්කොට සැලකීම්වලට සහ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක්වී ඇති අතර, ඒවා සිදුකළ පාර්ශව අතර පොලිසිය ද සිටී.

2. කායික පහරදීම්, වාචික හිංසනය, නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් සහ රඳවාගැනීම් ඇතුළු සිය ප්‍රජාවට එරෙහිව පොලිසිය විසින් සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සිද්ධීන් විශාල ප්‍රමාණයක් ශ්‍රී ලාංකික විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවක්‍රියාකාරීන් විසින් වාර්තා කොට ඇත. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් ඇති ආරක්ෂකාරී ස්ථාන වැටලීම සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින් අත්අඩංගුවමට ගැනීමට විවිධ මුලාකිරීමේ උපායමාර්ග යොදාගැනීම පිළිබඳව ද පොලිසියට චෝදනා එල්ල වී ඇත. මෙම ක්‍රියා විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරනවා පමණක් නොව, රාජ්‍යයේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් පිළිබඳව මහජන විශ්වාසයද පලුදු කරයි.

*''අපේ ජීවිතය අරගලයක්. අපේ කණ්ඩායමේ සාමාජිකයින් හයදෙනෙක් ඉන්නවා. 2021 වසරේ නොවැම්බර් මාසයේ දවසක හවස 6.30ට විතර අපි මුහුද පැත්තේ (තොල් ආලේපන සහ රූපලාවන්‍ය ආලේපන පාවිච්චි කරමින්) ඉඳිද්දී පොලිස් මුරසංචාරය කරන ජීප් එක ආවා. ත්‍රිකුණාමලය පොලිසියේ නිලධාරීන් අපිව අල්ලගෙන අපේ ජංගම දුරකථන ගත්තා. පොලිස් නිලධාරීන් කිව්වේ අපිත් එක්ක නිදාගන්න ආව කියල. පස්සේ ඒගොල්ලෝ අපිට වධදුන්නා (අපිට සින්දු කියන්නයි නටන්නයි කිව්වා). ඒගොල්ලෝ කලිසමේ සිපරය ගලවගෙන හරිම නරක විදියට හැසිරුනා. අපිව පැය තුනකට විතර පස්සේ නිදහස් කළා.''*

– ඉසාද්, අවුරුදු 32යි, ත්‍රිකුණාමලයේ වෙසෙන හරස්-විලාසිතා කරන පුද්ගලයකු ලෙස තමන්ව හඳුන්වාගනී.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වගන්තිය පවසන්නේ ''නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද, ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය'' යනුවෙන් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(3) වගන්තිය පවසන්නේ ''වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේද, ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකදී පෞද්ගලිකවම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට හිමිකම් ඇත්තේය'' යනුවෙනි. කෙසේනමුත්, ප්‍රජා උපදේශන සාකච්ඡා පෙන්වා දුන්නේ ඊට වෙනස් තත්වයකි. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවප්‍රජා සාමාජිකයින්, විශේෂයෙන්ම ලිංගික ශ්‍රමිකයින් ලෙස සේවය කරන පුද්ගලයින්, හෙලිකළ සිද්ධීන් කිහිපයකින් පැවසුනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති එම අයිතීන් ඔවුන්ට අහිමි කර ඇති බවයි.

*''සීදුව පොලිස් ස්ථානයේ ප්‍රධානියා සතෙක්. අපි වැඩ කරද්දි, ඒ කියන්නේ වාණිජ ලිංගික ශ්‍රමිකයින් විදියට වැඩ කරද්දී, එයා තවත් පොලිස් නිලධාරීන් කීපදෙනෙක් එක්ක සිවිල් ඇඳුමින් ඇවිත් අපිව අත්අඩංගුවට ගන්නේ මොකද කියලවත් කියන්නේ නැතුව අපිව පොලිස් ස්ථානයට ගෙනියනවා. අපි පොලිස් ස්ථානයට ගිය ගමන්ම අපි ප්‍රදර්ශන භාණ්ඩ වගේ ඒ වෙලාවේ සේවයේ ඉන්න හැම පොලිස් නිලධාරියටම අඬගහනවා අපිව බලන්න. පොලිස් ස්ථානය මැද්දේ අපේ ඇඳුම් ගලවන්න පවා අපිට නියෝග කරනවා. ඒවගේම අපේ පුද්ගලික අවයව වලට අමානුෂික විදියට පහර දෙනවා. අපිට සලකන්නෙ අයින්කරපු බඩුවලට වගේ. අන්තිමට අපිව උසාවියට ඉදිරිපත් කළාට පස්සේ තමයි අපිට දැනගන්න ලැබෙන්නෙ අපිට විරුද්ධව තියෙන චෝදනා මොනවද කියල.''*

– මයන්ති, අවුරුදු 42යි, පෑලියගොඩ නච්චි ප්‍රජාවේ සාමාජිකයකු ලෙස තමන්ව හඳුන්වාගනී.



© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

**4**. තවද, ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව පොලිසියෙන් එල්ලවන ප්‍රචණ්ඩත්වයට බොහෝ අවස්ථාවලදී වෙනස්කොට සැලකීම සහ කොන්කිරීම ඇතුළත් ය. එසේ ප්‍රචණ්ඩත්වයට ලක්වන විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින් තවදුරටත් වෙනස්කොට සැලකීමට සහ පලිගැනීමට ලක්වීමේ බිය හේතුවෙන් එම සිද්ධීන් පිළිබඳ පැමිණිලි කිරීමට පසුබට විය හැකිය. මෙම තත්වය හේතුවෙන් යුක්තිය ලබාගැනීම සහ වරදකරුවන් (අදාල සිද්ධීන්වලට) වගවන බව තහවුරු කිරීම අසීරු විය හැකි අතර, වින්දිතයින්ව අධෛර්යමත්වීම සිදුවිය හැකිය.

*''මගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා මට මගේ අසල්වැසියා සමග ගැටළු තිබුනා. මේ ගැන අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනුකරන්න උත්සාහ කළත්, මීට පස්සේ ''පො****ගේ ප්‍රශ්ණ'' පොලිසියට ගේන්න එපා කියල එතන හිටපු පොලිස් නිලධාරියා මට බැන්නා. පිරිමියෙක් විදියට අඳින පළඳින්න කියලත්, පිරිමියෙක් විදියට ඉන්න කියලත් එයා මට කිව්වා.''*

– නිමාලි, අවුරුදු 47යි, අම්බලන්ගොඩ වෙසෙන සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රියක් ලෙස තමන්ව හඳුන්වාගනී.




© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

## පරිච්ඡේදය 9 : නීති සහ ප්‍රතිපත්ති රාමු පිලිබඳව ඇති දැනුම සම්බන්ධ අඩුපාඩු

1. ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව තුළ රටේ පවතින නීති සහ ප්‍රතිපත්ති රාමුව පිළිබඳව පවතින අවබෝධයේ අඩුපාඩුවක් ඇති බව පුළුල් ලෙස පිළිගෙන ඇති කරුණකි. කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ලිංගික ක්‍රියා ශ්‍රී ලංකාවේ අපරාධීකරණය කොට ඇති අතර, විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ටම සුවිශේෂී වූ නීතිමය රැකවරණයක් නොමැත. එසේම, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතාවයහෝ ප්‍රකාශනය මත පදනම්ව සිදුවන වෙනස්කොට සැලකීම නීතියෙන් තහනම් කොට නොමැත. මෙම තත්වය විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ට දැඩි අභියෝගයක් එල්ලකළ හැකිය.

2. සහභාගී වූවන් පැහැදිලි කළ ආකාරයට, නීති සහ ප්‍රතිපත්ති රාමු පිලිබඳ දැනුම වර්ධනය කිරීමේදී මතුවන එක් අභියෝගයක් වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ පොදු ජනතාව අතර විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ ගැටලු පිළිබඳව පවතින පරිපූරක අධ්‍යාපනය සහ පුහුණුව නැති බවයි. වර්තමානයේ පවතින ඍණාත්මක සම්මතයන්, වෙනස්කොට සැලකීම්, සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව පවතින ප්‍රචණ්ඩත්වය නැවත වර්ධනය කිරීමට මෙම තත්වය දායක වේ




3. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ප්‍රධාන ධාරාවේ දේශපාලනික සංවාදය තුළ හොඳින් නියෝජනය නොවන බව සමීක්ෂණයට සහභාගී වූවන් තර්ක කළෝය. තමන් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව යනුවෙන් විවෘතව හඳුන්වාගන්නා ප්‍රසිද්ධ පුද්ගලයින් සිටින්නේ කිහිපදෙනෙකු පමණක් වන බැවින්, ප්‍රජා සාමාජිකයින් සමග පැවැත්වූ සාකච්ඡාවලදී පැවසුණු පරිදි, විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පිලිබඳ ඇති ප්‍රතිපත්ති බොහොමයක් සම්පාදනය වන්නේ ප්‍රජාවේ දැක්ම පිලිබඳ නිසි සාකච්ඡාවකින් තොරවයි.

4. තවද, වෙනස්කොට සැලකීම් හෝ අනෙකුත් ආකාරවල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ලක්වූ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ට ලබාගත හැක්කේ සීමා සහිත නීතිමය සහායක් බව සහභාගී වූවන් පවසන ලදී. නීතිඥයින් විසින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවපුද්ගලයින්ගේ නඩු ''විශේෂ නඩු'' ලෙස සලකන අතර, ඒ හේතුවෙන් එවැනි පුද්ගලයින්ව නියෝජනය කිරීමට වැඩි මුදලක් අය කරයි. මෙම තත්වය විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින් විසින් මුහුණපාන ආන්තිකකරණය සහ වෙනස්කොට සැලකීම තවදුරටත් අයහපත් කරයි.


© ඉක්විටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇව්රිණි.

## නිර්දේශ

- ''ඕනෑම පුරුෂයකු හෝ ස්ත්‍රියක්'' යන වචන දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තියෙන් ඉවත්කිරීම සඳහා එම වගන්තිය ඉවත්කිරීම හෝ සංශෝධනය කිරීම.
- කැමැත්තෙන් සිදුවන සම-ලිංගික ක්‍රියා අපරාධීකරණය කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය ඉවත්කිරීම.
- අයාලේයාමේ ආඥා පනත ඉවත් කිරීම.
- දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ නිර්වචන හෝ අර්ථදැක්වීම් ලබාදීම/ලබාගැනීම.
- විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා හා ප්‍රකාශන සහ ලිංගික දිශානති සහිත පුරවැසියන්ට හිමි මූලික අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ තහවුරු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය කිරීම, සහ මෙම ක්‍රියාවලියේදී 12(2) සහ 16 වැනි වගන්තිවලට වැඩි අවධානයක් ලබාදීම.
- දණ්ඩ නීති සංග්‍රහයේ අඩන්තේට්ටම් කිරීම යන වරදට අදාළ නීතිමය ප්‍රතිපාදන යටතේ පරිවර්තන චිකිත්සාව සලකා බැලීම.
- සෞඛ්‍ය සේවා හා ඖෂධ, සමාජ සේවා, සහ විවිධ ආයතන වලින් ලබාදෙන සේවා ලබාගැනීමේදී විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින් මුහුණපාන සියලුම ආකාරවල වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීමට පියවර ගැනීමට අවධානය යොමුකිරීම.
- දූෂණය කිරීම සහ ලිංගික අපරාධ පිලිබඳ ඇති සාමාන්‍ය නීති හරහා ඕනෑම පුද්ගලයකු දූෂණය වීම වරදක් ලෙස හඳුනාගැනීම.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන හිරිහැර මුලිනුපුටා දැමීමට, විවිධත්වය හා පිළිගැනීම තහවුරු වන ප්‍රමාණවත් ප්‍රතිපත්ති සේවා ස්ථාන තුළ හඳුන්වාදීම.
- ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවගේ අයිතීන් තහවුරු කිරීමට සංක්‍රාන්ති ආරක්ෂණ පනත් කෙටුම්පත නීතියක් ලෙස බලාත්මක කිරීම.
- විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව සිදුවන හිරිහැර මුලිනුපුටා දැමීම සඳහා ඉහත සඳහන් කළ නීතිමය වෙනස්කම්වලට අනුකූලව ශ්‍රී ලංකා පොලිසියට ප්‍රමාණවත් ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සහ අයිතීන් තහවුරු කිරීම සඳහා සීඩෝ සහ වදහිංසාවලට එරෙහි ප්‍රඥප්තිය වැනි එකඟ වී ඇති ජාත්‍යන්තර වගකීම් බලාත්මක කිරීම හරහා ප්‍රමාණවත් පිළිගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ට සේවා ස්ථානය තුළ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අංක 190 ප්‍රඥාප්තිය ස්ථිර කිරීම.
- විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පිළිබඳ දැනුම ඇතුළත් ජාතික තලයේ පුළුල් ලිංගික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.


© ඉක්වීටි ශ්‍රී ලංකා. සියලු හිමිකම් ඇවිරිණි.

Équité
ශ්‍රී ලංකා HUMANITY for ALL

ඉක්විටි ශ්‍රී ලංකා ප්‍රකාශනයකි – 2023 මැයි මස